# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2026 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය

(නව නිර්දේශය)

දහනව වන සියවසෙහි අපරදිග සාහිත්‍ය නිර්මාණ සහ විචාර අධ්‍යයනය

**LTCR 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බටහිර රොමැන්ටික් කාව්‍ය කලාවේ මූලිකාංග පිළිබඳ සනිදර්ශන ව විභාග කරන්න.

02. ඔලිවර් ට්විස්ට් **(Oliver Twist)** නවකතාවෙහි චරිත වෙතින් ප්‍රතිබිම්බිත එංගලන්ත සමාජය හා එහි අඩුරු පැතිකඩ යථාර්ථවාදී ප්‍රවේශයකින් සාකච්ඡා කරන්න.

03. යථාර්ථවාදය **(Realism)** යන්න න්‍යායාත්මකව විග්‍රහ කරන්න.

04. ධනේශ්වරයේ නැගීම මගින් ප්‍රංශ සමාජයේ මානව සබඳතා දුබල කරන ආකාරය සිත පිවිතුරු ළඳ **(Eugenie Grandet)** නවකතාව ඇසුරින් විමර්ශනය කරන්න.

05. රොමැන්ටික්වාදයේ ප්‍රභවයට තුඩුදුන් සමාජ සංස්කෘතික පදනම පිළිබඳ විමර්ශනයක් කරන්න.

06. රොමැන්ටික්වාදයට අනුගතව චිත්තාකර්ෂණීය චරිත නිරූපණයෙහි ලා වික්ටර් හියුගෝ දක්වන සාමර්ථ්‍යය මනුතාපය නවකතාව ඇසුරෙන් සාකච්ඡා කරන්න.

07. ඇන්ටන් චෙකෝෆ් පූර්ව විප්ලවීය රුසියානු ජන ජීවිතය තීක්ෂණාකාරයෙන් නිරූපණයෙහි ලා දැක් වූ සාමර්ථ්‍යය සනිදර්ශනව අගයන්න.

08. බලය, හෙජමොනිය සහ කාරකත්වය යන සංකල්ප පිළිබඳ ඉදිරිපත්ව ඇති මතවාද පරීක්ෂා කරන්න.

09. මානවවාදී සාහිත්‍ය විචාර නිර්දේශ පශ්චාත් විචාරක සම්ප්‍රදායයෙන් අභියෝගයට ලක් වූ ආකාරය පැහැදිලි කරන්න.

10. 16 වන සියවසින් පසු යුරෝපයේ ඇති වූ සමාජ, දේශපාලන වෙනස්කම් වෙත අවධානය යොමු කරමින් මාක්ස්වාදී දර්ශනයේ පදනම විමසන්න.

    නැතහොත්

    මාක්ස්වාදය හා සාහිත්‍ය විචාරය අතර ඇති සම්බන්ධය පෙන්වා දෙමින් ලාංකේය මාක්ස්වාදී සාහිත්‍ය විචාරය ගැන කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 20 බැගිනි)

*******************************